# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
# சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
# Department of Samurdhi Development

මුදල් අමාත්‍යාංශය
සමෘද්ධි , ගෘහ ආර්ථික , ක්ෂුද්‍ර මූල්‍ය , ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය
நிதி அமைச்சு
சமுர்த்தி, வதிவிடப் பொருளாதார,நுண்நிதிய, சுயதொழில்,மற்றும் வியாபார அபிவிருத்தி இராஜாங்க அமைச்சு
Ministry of Finance
State Ministry of Samurdhi, Household Economy, Micro Finance, Self Employment and Business Development


මගේ අංකය / எனது இல / My No: DSD/HO/ 02/AD/7/ස.නි.
ඔබේ අංකය / உமது இல / Your No: ..............................................
දිනය / திகதி / Date: 2021.11.01

දෙපාර්තමේන්තුවේ සියළුම නිලධාරීන් වෙත,

**<u>සහනදායි දුරකථන ඇමතුම් හා දත්ත පහසුකම් සැලසීම සම්බන්ධවයි.</u>**

ඉහත සඳහන් කරුණට අදාළව සමෘද්ධි වෙබ් අඩවියෙහි පල කරන ලද මගේ සමාංක හා 2021-07-15 දිනැති ලිපියට වැඩිමනක් වශයෙනි.

02. එමඟින් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ සේවය කරන සියළුම නිලධාරීන් වෙත හඳුන්වාදී ඇති ජංගම දුරකථන සහන පැකේජයන්හි ශ්‍රී ලංකා මොබිටෙල් ආයතනය විසින් හඳුන්වාදී තිබූ **<u>පසු ගෙවුම් සහන පැකේජයේ</u>** තැන්පත් මුදල වන රුපියල් 500.00 ක් ගෙවීම දෙපාර්තමේන්තුවේ මැදිහත්වීමෙන් නිදහස් කර ඇත. මෙම නිදහස් කිරීම කල හැකි වන්නේ දෙපාර්තමේන්තුවේ නිලධරයෙකු විසින් සහතිකර ඉදිරිපත් කරනු ලබන අයදුම් පත් වලට අනුව ලබා ගන්නා සිම්කාඩ් පත් සඳහා පමණක් වේ.

03. එමෙන්ම දෙපාර්තමේන්තුව මැදිහත්වීමෙන් මෙම සහන පැකේජයන් ලබා දීම සිදුකරන බැවින් යම් නිලධාරියෙකු බිල්පත ගෙවීම පැහැර හැරියහොත්, නිදහස් කරන ලද මෙම මූලික ගෙවීම වන රුපියල් 500.00ක මුදල ආදාළ නිලධාරීයාගේ වැටුපෙන් අයකර අදාළ ආයතනය වෙත ගෙවීමට එකගතාවය පල කරන ලද ලිපියක් **<u>පසු ගෙවුම් සහන පැකේජය යටතේ</u>** සිම්කාඩ් පත් ලබා ගන්නා සෑම නිලධරීයෙකු විසින්ම මේ සමඟ ඇති ආකෘතියට අනුව, තම එකඟතාව අයදුම්පත සමඟ සහතික කරනු ලබන නිලධාරි වෙත ඉදිරිපත් කළ යුතුය. එම එකඟතාවය සහතික කිරීම ප්‍රධාන කාර්යාලයේ අංශ ප්‍රධානියෙකු / දිස්ත්‍රික් කාර්යාලයේ දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ, නියෝජ්‍ය, සහකාර අධ්‍යක්ෂවරයෙකු / මූලස්ථාන සමෘද්ධි කළමණාකරු විසින් කළ හැකි වන අතර, ඔහුගේ හෝ ඇයගේ නිල මුද්‍රාව තබා එම එකඟතා ලිපිය තම අංශයේ විෂයභාර නිලධාරියෙකු වෙත සුරක්ෂිතව ගොනු කර තැබීම සඳහා භාර දිය යුතුය. එලෙස එකඟතාවය පල කළ නිලධාරින්ගේ අයදුම්පත් පමණක් සහතික කරනු ලබන නිලධාරින් විසින් සහතික කර නිල මුද්‍රාව තබා සිම්පත් ලබාගැනීම සඳහා ඉල්ලුම් කරනු ලබන නිලධාරියා වෙත භාර දිය යුතු.

04. මොබිටෙල් ආයතනය විසින් ලබා දී ඇති මෙම සහන පැකේජය ලබාදීමේ අවසන් දිනය 2021-11-30 වන බවත් එම ආයතනය විසින් දන්වා ඇති අතර, එම පැකේජය ලබා ගැනීමට කැමති නිලධාරීන් විසින් එදිනට පෙර තම අයදුම්පත් මොබිටෙල් නියෝජිත ආයතන වෙත ඉදිරිපත් කළ යුතුය. එමෙන්ම **<u>පෙර ගෙවුම් සේවා යටතේ සහන පැකේජය ලබා ගැනීම සඳහා</u>** දෙපාර්තමේන්තු නිලධාරියෙකුගේ සහතික කිරීමක් අවශ්‍ය නොවන අතර, ජාතික හැඳුනුම්පතේ සහ දෙපාර්තමේන්තු හැඳුනුම්පතේ ඡායා පිටපතක් හෝ පෙර මාසයේ වැටුප් වාර්තාවක් ඉදිරිපත් කිරීම ප්‍රමාණවත් බව එම ආයතනය විසින් දන්වා ඇත.

05. දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ පල කර ඇති මගේ සමාංක හා 2021-07-15 දිනැති ලිපියෙන් හඳුන්වා දී තිබූ Dialog, Airtel, Hutch ආයතනයන් මඟින් ඉදිරිපත් කර ඇති අනෙකුත් සහන පැකේජයන්හි වෙනසක් සිදු වී නොමැති බැවින් නිලධාරීන්ගේ අභිමතය පරිදි ඕනෑම සහන පැකේජයක් ලබා ගැනීමේ හැකියාව පවතින බවද වැඩිදුරටත් දන්වා සිටිමි.

කේ.එම්. මාලිනී කුමාරිහාමි
අධ්‍යක්ෂ (පාලන)
අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට

පිටපත්:-

1. ප්‍රධාන කාර්යාලයේ සියළුම අංශ ප්‍රධානීන්
2. දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්
3. දිස්ත්‍රික් සමෘද්ධි නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂවරුන්
4. මූලස්ථාන සමෘද්ධි කළමණාකරුවන්
5. මෙම කටයුතු සම්බන්ධීකරණය කිරීම සඳහා නම් කරන ලද සියළුම නිලධාරින්

දැ.ගැ.ස හා සියළුම නිලධාරින් දැනුවත් කිරීම සඳහා.